

# සිංහල

## 4 ශ්‍රේණිය

e තක්සලාව
Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

# 2 පාඩම

## නාම පද සොයමු.

ක්‍රියාකාරකම 1

- පෙළපොතේ "මුහුදු වෙරළ හා මුහුදු සත්තු" පාඩම (පිටු අංක 91-94) හොඳින් කියවමු. ඒ ඇසුරින් පහත වගුව සම්පූර්ණ කරමු.

| | පුද්ගල නාම | ද්‍රව්‍ය නාම | සත්ත්ව නාම | ස්ථාන නාම |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |

- අපි දැන් ලියූ නාම පදවලින් පුංචි තරගයක් පවත්වමු. මේ සඳහා ඔබගේ පවුලේ වැඩිහිටියන් ද සහභාගී කරගන්න.

පියවර 1

- ඔබ ලියූ නාම ප දතුණ්ඩුවල ලියා රෝල් කර කුඩා බඳුනකට දමා කලවම් කරන්න.

පියවර 2

- වරකට එක බැගින් එක් අයෙකු තුණ්ඩුවක් ලබාගෙන ශබ්ද නඟා කියවන්න. එය කුමන වගර්යකට අයත් නාම පදයක් දැ යි පවසන්න.

පියවර 3

- නිවැරදිපිළිතුරලබාදුන්විටලකුණු 10 ක් හිමි වේ.ලකුණු 10 ක් ලබා ගත්තේ නම් ඉතා හොඳයි. නැතිනම් තවත් වරක් උත්සාහ කරන්න.

අන්තර්ගතය : සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සැකසුම : එස්.ඒ.රුවන් ලක්මාල් සමරතුංග - ර/මැටිහක්වල විද්‍යාලය - ඕපනායක

### ක්‍රියාකාරකම 2

- 
- ඔබ නිවසේ /ගෙවත්තේ ඇති පණ ඇති සහ පණ නැති දේ මොනවා දැ යි සොයා බලන්න. ඉන් පහක් (6 cm x 3 cm) ප්‍රමාණයේ කාඩ්පත්වල ලියාගන්න.
- ඒවා පණ ඇති සහ පණ නැති වශයෙන් ගොඩවල් දෙකකට වෙන් කරගන්න.
- වෙන් කරන ලද පද බ්‍රිස්ට්ල් බෝඩ් එකක අලවන්න.

### ක්‍රියාකාරකම 3

- පෙළ පොතේ, " **රාධාට ලියුමක්** " (පිටු අංක 75,76 )පාඩමේ සඳහන් ස්ත්‍රී සහ පුරුෂ බව හඟවන පද සොයා ගනිමු. ඒවා යටින් ඉරක් අඳිමු.
- සොයාගත් ස්ත්‍රී ලිංග පදයට ගැළපෙන පුරුෂ ලිංග පදයත්, පුරුෂ ලිංග පදයට ගැළපෙන ස්ත්‍රී ලිංග පදයත් ශබ්ද නඟා කියවමු. වගු ගත කරමු.

| | ස්ත්‍රී ලිංග පද | පුරුෂ ලිංග පද |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |

## ක්‍රියාකාරකම 4

පහත දක්වා ඇති ඒක වචන නාම පදවලට අයත් බහු වචන නාම පදය ලියමු.

| | ඒක වචන පද | බහු වචන පද |
|---|---|---|
| 1 | මල | |
| 2 | ගස | |
| 3 | මාළුවා | |
| 4 | පැන | |
| 5 | බෝලය | |
| 6 | පොත | |
| 7 | නැව | |
| 8 | අත | |
| 9 | ළමයා | |
| 10 | තරුව | |
| 11 | බෝතලය | |

- ඔබ කැමති නාම පද පහක් භාවිත කර වාක්‍ය පහක් නිමර්ාණය කරමු. (එක් වාක්‍යයක් වචන පහකට නොඅඩු විය යුතු ය.)

1.........................................................................................................

2.........................................................................................................

3.........................................................................................................

4.........................................................................................................

5.........................................................................................................

- වාක්‍ය නිවැරදිව ලියා ඇත්දැයි බලන්න. ලියා ඇත්නම් ඉතා හොඳයි.අඩුපාඩු ඇත්නම් නැවත උත්සාහ කරන්න.